# <u>සිවිල් සමාජ අරමුදල (CSF) - පොදු උපදෙස්</u>

**වැඩසටහන පිළිබඳව**

ලෝක බැංකු ශ්‍රී ලංකා කාර්යාලය මඟින් ලබාදෙනු ලබන සුළු ආධාර ප්‍රදානයන් සැපයීම මඟින් ප්‍රජා නිරතවීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා සිවිල් සමාජ අරමුදල (CSF) ආධාර කරයි.

සිවිල් සමාජ අරමුදල, සංවර්ධනමය ප්‍රතිඵල වලට බලපෑම් කරන සහ ඒවා වැඩි දියුණු කරන මූලාරම්භයන් ගැනීම සඳහා පුද්ගලයන්ට හැකිවන සහ ඔවුන්ට ඒ සඳහා හැකියාව ලබා දෙන ක්‍රියාකාරකම් වලට මුල පිරීම සහ ආධාර කිරීම සිදු කරයි. මෙම ක්‍රියාකාරකම්, අන්තර්ගත කිරීම, වගකීමට ඇති හැකියාව සහ සහභාගීත්වය සඳහා වන යාන්ත්‍රණ ශක්තිමත් කරයි. තවද මෙම ක්‍රියාකාරකම් රාජ්‍ය අංශය, අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සහ පෞද්ගලික අංශය සමඟ හවුල්කාරීත්වයන් ශක්තිමත් කරයි.

**සිවිල් සමාජ සංවිධාන සඳහා උපදෙස්**

සිංහල | දෙමළ

ඔබ අයදුම් කිරීමට පෙර

අයදුම් කළ හැක්කේ කාටද?

මෙමඟින් ආධාර කරනු ලබන්නේ කුමන ආකාරයේ ක්‍රියාකාරකම් සඳහාද?

මෙමඟින් ආධාර නොකරනුයේ කුමන් ආකාරයේ ක්‍රියාකාරකම් සඳහාද?

ප්‍රදානයන් සඳහා තේරීම් නිර්ණායක

කුමන ප්‍රමාණයේ ප්‍රදානයන් ලබා දෙන්නේද?

ප්‍රදානයන් සඳහා අයදුම් කරන්නේ කෙසේද?

සම්බන්ධ කර ගත යුත්තේ කව්රුන්ද?

**අයදුම් පත්‍රිකාව ලබා ගැනීම** - ඉංග්‍රීසි | සිංහල | දෙමළ

අංක 1 : ප්‍රජා නිරතවීම් හි ප්‍රතිඵල

ප්‍රජා නිරතවීම් වලට පහත දක්වා ඇති දේ කල හැක .....

- දැනුම බෙදා ගැනීමේ ජාලයන් නිර්මාණය කිරීම, අවබෝධය සඳහා පොදු ඒකඟතාවයක් ගොඩ නැගීම, රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර සහයෝගීතාව ඇති කිරීම සඳහා අනුබල දීම සහ සමහර විටෙක පීඩනයන් ඇති කිරීම මඟින් පවා ප්‍රතිසංස්කරණයන් සහ දේශීය දුගීභාවය අවම කරලීම සහ සංවර්ධන ක්‍රමෝපාය සඳහා මහජන මතය සහ ප්‍රාදේශීය අයිතිකාරීත්වය ප්‍රවර්ධනය කිරීම;

- ප්‍රාථමික සහ ද්විතීයික පාර්ශ්වකරුවන්ගේ, විශේෂයෙන්ම දුගී සහ කොන් කරන ලද ජන කොටස් වල අවශ්‍යතාවන්ට හඬක් ලබා දීම සහ ඔවුන්ගේ අදහස් ප්‍රතිපත්තිමය සහ වැඩසටහන් තීරණවලට අන්තර්ගත කර ගැනීම තහවුරු කිරීමට උපකාර වීම;

- විශේෂයෙන්ම ප්‍රජා මට්ටමේදී, ප්‍රාදේශීය දැනුම ලබාදීම, ඇතිවිය හැකි අවදානම් සහගත තත්වයන් හදුනා ගැනීම, අනුග්‍රහය ඉලක්ක කිරීම සහ අරමුණු කරා ළඟා වීමේ හැකියාව පුළුල් කිරීම මගින් සංවර්ධන වැඩසටහන් හි බලපෑම ශක්තිමත් කිරීම සහ එය මුදුන් පමුණුවා ගැනීම;

- දේශීය සහ ගෝලීය වශයෙන් ඇති සංවර්ධන අභියෝගයන් සඳහා නව්‍ය අදහස් සහ විසඳුම් ගෙන ඒම.

- යහපාලනය සඳහා පරිසරය සකස් කරමින් සංවර්ධන ක්‍රියාකාරකම්හි විනිවිද භාවය සහ වගකීම්සහගත බව වැඩි දියුණු කිරීම.

**ඔබ අයදුම් කිරීමට පෙර**

සිවිල් සමාජ අරමුදලට හැකියාව ඇත්තේ ලැබෙන අයදුම්පත් වලින් ඉතාම සුළු ප්‍රතිශතයකට පමණක් අරමුදල් ලබා දීමටයි. බොහෝ ඉල්ලීම් නොසලකා හැරීමට හේතුව වන්නේ ඒවා සුදුසුකම් වලින් අඩු වීම නොව ඒවා, තෝරා ගනු ලැබූ යෝජනා මෙන් සිවිල් සමාජ අරමුදලෙහි නිර්ණායකයන් හෝ වර්තමාන අරමුණු සමඟ හෝ නොගැලපීමයි. ඔබගේ ක්‍රියාකාරකම අරමුණු සමඟ හෝ නිර්ණායක සමඟ අනුකූල විය හැකි නමුත් ප්‍රදානය කිරීමට ඇති මුදල් ප්‍රමාණය අභිබවා ඒ සඳහා වන ඉල්ලුම වැඩි විය හැක.

අයදුම් කිරීමට පෙර, ගැලපීමක් ඇත්දැයි සොයා බැලීමට දී ඇති උපදෙස් කියවීමට කරුණාකර කාලය ගන්න.

අයදුම් කළ හැක්කේ කාටද?

- සංවර්ධන ගැටලු පිළිබඳ කටයුතු කරන ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන වලට ආධාර ප්‍රදානයක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

- සිවිල් සමාජ සංවිධාන යහපත් ප්‍රතිරූපයක්, සමාජය තුළ ඉලක්ක සපුරා ගත් බවට වාර්තාවක් සහ මූල්‍යමය විශ්වාසවන්ත භාවය පිළිබඳ වාර්තාවක් සහිත විය යුතුය.

- පෙර වසර වලදී මෙම වැඩසටහන මඟින් ආධාර නොලැබූ සංවිධානවලට ප්‍රමුඛතාවය දෙනු ඇත. (වසර පහක කාලයක් තුල සිවිල් සමාජ අරමුදල මගින් ආධාර ප්‍රදානයන් තුනකට වඩා මෙම සංවිධානවලට ලබා ගත නොහැක).

කුමන ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා ආධාර කරනු ලබන්නේද?

- ප්‍රජා නිරතවීම් මූලික අරමුණ ක්‍රියාකාරකම් සඳහා ආධාර කරයි

ඊට අමතරව :

- ප්‍රජා නිරතවීම් කුසලතා සහ/හෝ දැනුම වැඩි දියුණු කිරීමට වැඩමුළු සහ සම්මන්ත්‍රණ; ප්‍රතිපත්ති සම්පාදනය හෝ රාජ්‍ය සේවා බෙදාහැරීම සඳහා බලපෑම් කිරීමට සුදුසු සන්නිවේදන වැඩසටහන්; හෝ අදාළ අංශයෙහි වපසරිය ගොඩනැගීමට නව්‍ය ජාලකරණයන් මෙම ක්‍රියාකාරකම් වලට අන්තර්ගත වන නමුත් මේවාට සීමා නොවේ.

- අදාළ කටයුත්ත ආධාර මුදල ප්‍රදානය කළ දින සිට වසරක කාලයක් තුළ සම්පූර්ණ කළ යුතුය.

- පෙර වසර වලදී වැඩසටහන මඟින් ආධාර කරනු නොලැබූ සංවිධාන කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ඇත.

කුමන ආකාරයේ ක්‍රියාකාරකම් වලට ආධාර නොකරන්නේද?

සිවිල් සමාජ අරමුදල මඟින්, පර්යේෂණ වැඩසටහන්, විධිමත් උසස් අධ්‍යාපන පුහුණු වැඩසටහන්, මෙහෙයුම් ව්‍යාපෘති, දැනට පවත්වා ගෙන යනු ලබන ආයතනික හර ආධාර (ක්‍රියාකාරිත්වයට අදාල නොවන උපකරණ වැනි) ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, අධ්‍යාපන වැඩසහන්, තමන් විසින් තමන් සඳහා අයදුම් කරන පුද්ගලයින් හෝ නීතිමය නොවන වපසරීන් වෙත ආධාර ප්‍රදානය කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න. යෝජිත ක්‍රියාකාරකම්, සාමාන්‍ය ලෝක බැංකු ක්‍රමෝපායයන් සමඟ තරඟ කිරීම හෝ ඊට ආදේශකයක් ලෙස කටයුතු කිරිම නොවිය යුතුය; ලෝක බැංකුවේ සාමාන්‍ය වැඩ සටහන් වලින් ඒවා පැහැදිලිව වෙන් කළ හැකිවිය යුතුය.

පහත දක්වා ඇති ආකාරයේ ක්‍රියාකාරකම්වලට සිවිල් සමාජ අරමුදල මඟින් ආධාර කළ නොහැක :

- සෘජු සේවා සැපයීම;
- රෝහල් උපකරණ, ශ්‍රව්‍ය උපකරණ, අත්වාරු වැනි වෛද්‍ය උපකරණ;
- පරිගණක උපකරණ සහ සවි කිරීම්;
- කුලී, නඩත්තු හෝ සමාන්‍ය කාර්යයාල උපකරණ සැපයුම් වැනි අධික පිරිවැය;
- ව්‍යාපාරික කුසලතා පුහුණු කිරීමේ, රැකියා වියුක්තිකයන් සඳහා වන පුහුණු වැඩසටහන්, එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, මූලික නිරතවීම් අරමුණක් තිබුණ හොත් හැරෙන්නට;
- සිවිල් සමාජ සංවිධානයන් හි වපසරිය ගොඩනැගීම, එවිට ලෝක බැංකුවේ ව්‍යපෘතින්හි සේවා දායකයන් / වෘත්තීය විශේෂඥයන් බවට පත්විය හැක;
- ජලය, උණුසුම්, ආහාර ලබා දීම වැනි මූලික අවශ්‍යතා සපුරා ලීම.

- පුස්තකාල හෝ සනීපාරක්‍ෂක පහසුකම් වැනි පහසුකම් ගොඩ නැගීම;
- රැකියා නිර්මාණය හෝ සේවා නියුක්තිය;
- රෝග පාලන වැඩසටහන්;
- ආහාර ආධාර
- උදාහරණයක් වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්‍ෂකගේ වැනි පූරණ කාලීන වැටුප්;
- ජල පද්ධති, ලිං වැනි යටිතල පහසුකම්

ආධාර ප්‍රදානයන් සඳහා තෝරාගැනීමේ නිර්ණායක

මූලික තේරීම් නිර්ණායක පහත දැක්වෙන පරිදි වේ.

**සඵලදායි බව** : ප්‍රජා නිරතවීමෙහි අරමුණ යෝජනා පත්‍රය මඟින් සාකච්ඡාවට බඳුන් කරන්නේද? විශේෂ වශයෙන් ,සංවර්ධන ප්‍රතිඵල වලට බලපෑම් කිරීමට සහ ඒවා වැඩි දියුණු කිරීම සඳහා අන්තර්ගත වීම,වගකීම් සහගතභාවය සහ සහභාගීත්වය යන කරුණු සඳහා වන යාන්ත්‍රණ ශක්තිමත් කිරීමට රාජ්‍ය අංශය සමඟ කටයුතු කරන තනි පුද්ගලයන් ලෙස හෝ සංවිධානගත කණ්ඩායම් ලෙස හෝ වන පුරවැසියන් හට මෙම ක්‍රියාකාරකම් උපකාර වන්නේද?

**ප්‍රායෝගික බව** : යෝජිත ප්‍රවේශය ප්‍රායෝගිකද? කාලරාමුව සහ අයවැය සුදුසු මට්ටමේ පවතීද?

**සංවිධානමය හැකියාව** : සංවිධානයේ කාර්ය මණ්ඩලය සහ නිලධාරී මණ්ඩලය ව්‍යපෘතියට දායක කරන කුසලතා මොනවාද? ඒවා ව්‍යපෘතියෙහි අරමුණුවලට අදාළ වන්නේද? සංවිධානය ඔවුන් වර්තමානයේ යෝජනා කරන අන්දමේ ප්‍රමාණයකින් හා වපසරයකින් යුතු ජයග්‍රහණ ලබා ගැනීමට සමත්ව තිබේද?

**සංවිධානමය විශ්වාසනීයත්වය** : තම ප්‍රජාව තුළ සහ ඉන් පිටත කණ්ඩායමට ඇත්තේ කුමන ආකාරයේ ප්‍රතිරූපයක්ද?

**වැදගත්කම** : ව්‍යාපෘතිය වැදගත්කමකින් යුතු වුවක්ද? යෝජනාව සමාජයට අවශ්‍ය ක්‍රියාව ඉලක්ක කරනු ඇති බවට සාක්ෂි තිබේද? එය ආධාර කිරීමට අදහස් කරන හෝ සාකච්ඡාවට බඳුන් කරන ගැටලුව විසඳීමට අපේක්ෂා කරන සමාජය තුළ වෙනසක් සිදු කරයිද? ආධාර සඳහා ඔබගේ අනෙකුත් අවස්ථාවන් සඳහන් කරන විටදී මේ අවස්ථාවේදී උපකාර කළ යුතු නියම දෙය එයද?

**සමතුලිතභාවය** : භූගෝලීය සාධක ස්ත්‍රී/පුරුෂභාවය ආදී වූ කරුණු මඟින් ලෝක බැංකුවේ ශ්‍රී ලංකා කාර්යයාලය මෙම ක්‍රියාකාරකම් තුලනය කරනු ඇත.

කුමන ප්‍රමාණයේ ආධාර ප්‍රදානයන් කරනු ලබන්නේද?

ඇමෙරිකානු ඩොලර් 9000 ක් දක්වා මුදලක් ආධාර ප්‍රදානයන් දෙනු ලැබේ. ක්‍රියාකාරකමක් සඳහා යෝජිත අයවැයෙන් භාගයකට වඩා සිවිල් සමාජ අරමුදල විසින් දෙනු ලබන්නේ ඉතා කලාතුරකින් වන අතර, එබැවින් වෙනත් මූලාශ්‍ර වලින් අතිරේක ප්‍රදානයන් ලබා ගැනීමට එම ප්‍රදානයන් උපකාරී වනු දැකීමට කැමති වේ. ලෝක බැංකුවෙන් සංවිධානයකට ලබා දෙන ආධාර ප්‍රදානයක් එම සංවිධානයට අනෙක් ආධාර ප්‍රදානය කරන්නන්ගෙන් ඉතිරි අරමුදල් සම්පූර්ණ කර ගැනීමට උපකාර වනු ඇත්තේ කෙසේද යන්න පැහැදිලි කිරීමට අයදුම්කාර සංවිධාන වලින් ඉල්ලුම් කෙරේ.

**ආධාර ප්‍රදානයක් සඳහා අයදුම් කරන්නේ කෙසේද?**

**යෝජනා පත්‍රයක් ලිවීම සඳහා කෙටි පාඨමාලාව**

ඉංග්‍රීසි | සිංහල | දෙමළ

සිවිල් සමාජ අරමුදල , ලෝක බැංකු ශ්‍රී ලංකා කාර්යයාලයෙන් පිටත සිට පරිපාලනය වනු ලබන අතර, වසරකට එක් වරක් පමණක් අයදුම්පත් කැඳවා තීරණ ගනු ලබයි.

ලෝක බැංකු ශ්‍රී ලංකා කාර්යයාලය මඟින්  රැස් කරනු ලබන සිවිල් සමාජ අරමුදල් කමිටුවක් මඟින් ආධාර මුදල් ප්‍රදානය කරනු ලැබේ. අවශ්‍ය නිර්ණායකයන් සපුරා ඇත්දැයි සොයා බැලීමට සහ තහවුරු කිරීමට අයදුම්පත් පරීක්ෂා කර බැලේ. සියලු සිවිල් සමාජ අරමුදල යෝජනාපත්  කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරයි.

සිවිල් සමාජ සංවිධාන අරමුදල සඳහා අයදුම්පත්‍ර සහ උපදෙස් සහ සිංහල, ඉංග්‍රීසි සහ දමිළ යන භාෂා තුනෙන්ම ලියවුණු "යෝජනා පත්‍රයක් ලිවීම සඳහා කෙටි පාඨමාලාව" යනුවෙන් වූ කුඩා අත්පොතක් කොළඹ 3, ගාලු පාරේ අංක 73/5 දරණ ස්ථානයේ පිහිටි ලෝක බැංකු කොළඹ කාර්යයාලයේ විමසීම් කවුන්ටරයෙන් ලබාගත හැක.

**සම්බන්ධ කර ගත යුතු වන්නේ කව්රුන්ද?**

තැපෑලෙන් හෝ ඊ-මේල් මඟින් අයදුම්පත්‍රයේ පිටපත් ලබා ගැනීමට කරුණාකර කෙරීමා තිලකසේන මිය ඉහත ලිපිනයෙන් හෝ kthilakasena@worldbank.org  යන ඊ-මේල් ලිපිනයෙන්, දුරකථන අංක 5561318 සම්බන්ධ කර ගත හැක.

අදාළ සහභාගීත්ව රාජ්‍ය කාර්යයාලයට අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර අයදුම්පත්‍රය සහ නිර්ණායකයන් විමසිල්ලෙන් කියවා බැලීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

ප්‍රදානලාභීන් විසින් ලෝක බැංකු කාර්යාලයට එවනු ලබන අති විශාල අයදුම්පත් ප්‍රමාණය අනුව පෞද්ගලික හමුවීම් සහ දුරකතන ඇමතුම් සඳහා අනුබල දෙනු නොලැබේ.

සිවිල් සමාජ සංවිධාන සඳහා අතිරේක සම්පත් www.worldbank.lk යන ලෝක බැංකු වෙබ් අඩවියෙන් සහ ලෝක බැංකු කොළඹ කාර්යයාලයේ දෙවන මහලේ පිහිටි මහජන තොරතුරු මධ්‍යස්ථානයෙන් ලබා ගත හැක.